## 195 දෙවියනේ ඔබ

දෙවියනේ ඔබ ඔබේ සෙනගට
තිබඳ පෙන්වති යහ ගුණේ
තවද පිරිසිදු සිතැතියන් හට
ඉවරයක් නැති මෙත් ගුණේ

මා ළඟින් ඔබ සිටියොතින් මට
දෙවියනේ ඇති දෙවියනේ //

නමුත් තව එක මොහොතකින් මගේ
යනු අතේ පා පැකිළිලා
මගේ පියවර ඩිංගෙකින් තව
යන්න තිබුණේ ගැස්සිලා

බලා සිටියෙමි අදම්වුන්ගේ
ඉසුරු සැප උන් වළඳනා
උඩඟු උන් ගැනැ මෙසේ මගෙ සිත
ඉරිසියාවෙන් පිරිලා

නුවණ වැටැහුම් නැති තිරිසනුන්
වගේ වෙමි ඔබ ඉදිරියේ
සිටි නිසා තිති මුවාවේ ඔබ
ගත්හ ඔබ මා සුරතිනේ

සගේ නැත මට කෙනෙක් ඔබ ඇරැ
කිසිත් නැ මට මිහිපිටේ
ඇලුම් වන්නට ඇති එකමැ දේ
ඔබ මැ පමණකි දෙවියනේ

මගේ සම් මස් මගේ හදවත
ගියත් පිරිහී කමක් නැ
එහෙත් දෙවියෝ වෙතිම සව්බල
උරුමේ කොටසත් සදහටේ